සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ, ආදායම් සේවයේ III වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ
බඳු නිලධාරින් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2006(2007)

# සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය

පැය එකයි

## II කොටස - සාමාන්‍ය දැනීම

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවේ ඇති**
**තිත් ඉර මත ද ලියන්න.**

..................................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

..............................................

වැදගත් :

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **06** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.
- ✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.
- ✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය එකකි.**
- ✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- ✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**
- ✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
- ✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- ✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහ මකන දියර භාවිත කරන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 10 | |
| 3 | 11 - 20 | |
| 4 | 21 - 29 | |
| 5 | 30 - 38 | |
| 6 | 39 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

- අංක **1** සිට අංක **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු **හතර** අතුරෙන් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර** තෝරා එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

1. ජනවාරි 1 වන දා වසරේ පළමුවන දිනය වශයෙන් ප්‍රථම වරට ප්‍රකාශයට පත් කළ රජතුමා වන්නේ
   (1) ජුලියස් සීසර් (2) ඔගස්ටස් සීසර්
   (3) මහා ඇලෙක්සැන්ඩර් (4) පස්වන ජෝර්ජ් (.........)

2. යුස්ටස් රිචඩ් ද සිල්වා යන නමින් මුල දී හැඳින් වූ නාට්‍යකරුවා නම්
   (1) සුගතපාල ද සිල්වා (2) එදිරිවීර සරච්චන්ද්‍ර
   (3) නීතිඥ ජෝන් ද සිල්වා (4) දි.වි. රිචඩ් ද සිල්වා (.........)

3. ඉස්ලාම් ලෝකයේ අද්භූත සංචාරකයා ලෙස හැඳින්වෙන දේශාටකයා වන්නේ
   (1) ක්වෙරෝස් (2) ඉබන් බතූතා
   (3) පාහියං (4) මාර්කෝපෝලෝ (.........)

4. සෞදි අරාබියේ මක්කම නගරයේ පිහිටි "කාබා" දේවස්ථානය ලොව ප්‍රකට කුමන හේතුව නිසා ද?
   (1) එය පැරණි ම මුස්ලිම් දේවස්ථානය නිසා ය.
   (2) එය ලොව විශාලත ම මුස්ලිම් දේවස්ථානය නිසා ය.
   (3) මහමත්තුමන්ගේ පාදස්පර්ශය ලද නිසා ය.
   (4) විවිධ හාස්කම් මඟින් බැතිමතුන්ට සහනය සලසන නිසා ය. (.........)

5. අලුත්නුවර දෙවොලට සම්බන්ධ දෙවියන් වන්නේ
   (1) ඊශ්වර දෙවියන් (2) විෂ්ණු දෙවියන්
   (3) ගම්භාර දෙවියන් (4) දැඩිමුණ්ඩ දෙවියන් (.........)

6. ආචාර්ය ඊ.ඒ.පී. දැරණියගල මෙරට ප්‍රකට වූයේ
   (1) ප්‍රථම සිංහල කෞතුකාගාර අධ්‍යක්ෂවරයා වීම නිසා ය.
   (2) ලංකා විශ්ව විද්‍යාලයේ ප්‍රථම පුරා විද්‍යා කතිකාචාර්යවරයා වීම නිසා ය.
   (3) ප්‍රථම පුරාවිද්‍යා අධ්‍යක්ෂවරයා වීම නිසා ය.
   (4) සී.පී. බෙල් සමඟ සීගිරි චිත්‍ර සොයා ගැනීම නිසා ය. (.........)

7. ඉන්දියානු නිදහස් සටනේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ, හදිසි ගුවන් අනතුරකින් මියගිය නායකයා
   (1) විනෝභා බාවේ ය. (2) සුභාෂ් චන්ද්‍රබෝස් ය.
   (3) වී.වී.ගිරිය ය. (4) අම්බෙඩ්කාර්ය ය. (.........)

8. වැඩිම "ඔස්කාර්" සම්මාන ප්‍රමාණයක් දිනා ඇති ලෝ ප්‍රකට චිත්‍රපටය නම්
   (1) ටෙන් කමාන්ඩ්මන්ඩ්ස් (2) බෙන්හර්
   (3) ජුරාසික් පාක් (4) ලෝරන්ස් ඔෆ් ඇරේබියා (.........)

9. යේසුස් වහන්සේගේ රූප සිතුවමක් සහිත ශ්‍රී ලංකාවේ එකම බෞද්ධ විහාරය
   (1) කෝට්ටේ රජමහා විහාරයයි. (2) කොළඹ දීපදුත්තාරාමයයි.
   (3) මීගමුවේ අඟුරුකාරමුල්ල රජමහා විහාරයයි. (4) කුරුණෑගල රිදී විහාරයයි. (.........)

10. චිත්‍රපටයට නගන ලද ප්‍රථම සිංහල රහස් පරීක්ෂක නවකතාව
   (1) ඩිංගිරි මැණිකා (2) හිනන කොල්ලා
   (3) සිරියලතා (4) දෙයියන්ගේ රටේ (.........)

[ 3 වැනි පිටුව බලන්න.

**විභාග අංකය :.......................**

11. එක්සත් ජනපද ජනපති ජෝර්ජ් වොෂිංටන් ප්‍රබල චරිතයක් වන්නේ
    (1) වහල් මෙහෙය අවසන් කිරීම නිසා ය.
    (2) II වන ලෝක යුද්ධයේ දී මිත්‍ර පාර්ශ්වය වෙනුවෙන් ඉටු කළ මෙහෙය නිසා ය.
    (3) එරට ප්‍රථම ජනාධිපතිවරයා වීම නිසා ය.
    (4) එවක පැවැති ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය රටට උචිත ලෙස වෙනස් කිරීම නිසා ය. (.........)

12. ලොව උසම කඳු ශිඛරය වන ඉන්දියාවේ "එවරස්ට්" ශිඛරයට එම නම ලැබුණේ
    (1) ඉන්දියාවේ මුල්ම මිනුම්පතිවරයා සිහිවීම වෙනුවෙනි.
    (2) ප්‍රථම වරට කඳු ශිඛරය තරණය කළ පුද්ගලයා වෙනුවෙනි.
    (3) ගෝවේ ආණ්ඩුකාරවරයා සිහිවීම වෙනුවෙනි.
    (4) ගුවන් යානයකින් කඳු මුදුනට පැමිණි එංගලන්ත ජාතිකයා සිහිවීම වෙනුවෙනි. (.........)

13. ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ රුපියල් ශත ක්‍රමය භාවිතයට පැමිණියේ කවදා ද?
    (1) 1948 පෙබරවාරි 04 (2) 1901 ජනවාරි 01
    (3) 1956 ජුනි 10 (4) 1869 ජුනි 18 (.........)

14. කාන්තාවට ඡන්ද බලය හිමි කර දුන් ලොව ප්‍රථම රාජ්‍යය වන්නේ
    (1) එංගලන්තය (2) නවසීලන්තය
    (3) ඉන්දියාව (4) කැනඩාව (.........)

15. "දළදා සිරිත" කෘතියෙහි අඩංගු වන්නේ
    (1) ශ්‍රී ලංකාවට දළදාව වැඩමවීමේ තොරතුරු ය.
    (2) දළදා මාළිගාවට අදාළ ඓතිහාසික තොරතුරු ය.
    (3) දළදාවට කළ යුතු පුද පූජා ආකාර විස්තර තොරතුරු ය.
    (4) දළදා පෙරහැරට අදාළ ඓතිහාසික තොරතුරු ය. (.........)

16. නැකැත් සකස් කිරීමට අදාළ කාර්යයක දී අනිවාර්යයෙන් මූලික වන ග්‍රහයන් දෙදෙනා ලෙස ජ්‍යොතිෂයේ සලකන්නේ
    (1) චන්ද්‍රයා හා සූර්යයා ය. (2) බ්‍රහස්පතී හා චන්ද්‍රයා ය.
    (3) අඟහරු හා සෙනසුරු ය. (4) සෙනසුරු හා සූර්යයා ය. (.........)

17. "ආහාර සුලභ වේවා" හෙවත් "Let there be bread" යන ආදර්ශ පාඨය අඩංගු ලෝක ප්‍රසිද්ධ සංවිධානය
    (1) ලෝක සාගිනි නිවීමේ ව්‍යාපාරයයි. (2) ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයයි.
    (3) ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවිධානයයි. (4) ලෝක ආහාර වැඩ සටහනයි. (.........)

18. අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් වූ ශ්‍රී ලංකාවේ එකම අග්‍රාමාත්‍යවරයා කවුද?
    (1) ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා ය. (2) ඩඩ්ලි සේනානායක මහතා ය.
    (3) ඩී.එස්. සේනානායක මහතා ය. (4) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ය. (.........)

19. 2007 වසරේ මාර්තු මස පැවති සරසවි සම්මාන උළෙලේ දී 2006 වසරේ හොඳම චිත්‍රපටයට හිමි සම්මානය හිමිවූයේ
    (1) හේරුණ්ඩ පක්ෂියා – සරත් ධර්මසිරි (2) අම්මාවරුනේ – ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්
    (3) උඩුගංයාමය – සුදත් දේවප්‍රිය (4) හිරිපොද වැස්ස – උදයකාන්ත වර්ණසූරිය (.........)

20. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අයත් අමාත්‍යංශය වන්නේ
    (1) තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යංශයයි.
    (2) ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයයි.
    (3) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයයි.
    (4) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශයයි. (.........)

[ 4 වැනි පිටුව බලන්න.

21. ව්‍යවස්ථාදායක මණ්ඩලයක් හා ස්වාධීන කොමිෂන් සභා හතරක් පිහිටුවීමට ගෙන ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වන්නේ

(1) 11 වන සංශෝධනයයි. (2) 13 වන සංශෝධනයයි.
(3) 15 වන සංශෝධනයයි. (4) 17 වන සංශෝධනයයි. (.........)

22. 1971 හඳුන්වා දී 1979 ඉවත් කළ රාජ්‍ය සේවකයන් සඳහා වූ බදු වර්ගය කුමක් ද?

(1) දළ ඉපැයුම් මත වූ පුනරුත්ථාපන බද්ද (2) උපයන විට ගෙවීමේ බද්ද
(3) ආරක්ෂක බද්ද (4) ජාතිය ගලවා ගැනීමේ බද්ද (.........)

23. ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය ප්‍රතිව්‍යුහගත හා විධිමත් කිරීම සඳහා 1966 පත් කළ කමිටුව නම්

(1) බදු සමාලෝචන කමිටුව (2) බදු කොමිසම
(3) බදු විමර්ශන කොමිසම (4) කැලිඩෝර් කොමිසම (.........)

24. පසුගිය අඩ සියවස තුළ ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ

(1) 1950 සිට ආර්ථික ස්ථායිකරණ අරමුණු ප්‍රධාන විය.
(2) 1960 සිට 1977 දක්වා ආර්ථික සංවර්ධන අරමුණු ප්‍රධාන විය.
(3) 1977 සිට 1989 දක්වා ආර්ථික ස්ථායිකරණ සහ ආර්ථික සංවර්ධන අරමුණු ප්‍රධාන විය.
(4) 1990 ට පසු විදේශීය අරමුදල් මෙරටට ගලා ඒම පාලනය ප්‍රධාන විය. (.........)

25. ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ වගකීම දරන්නේ

(1) මහා භාණ්ඩාගාරයයි. (2) ශ්‍රී ලංකා මහ බැංකුවයි.
(3) මුදල් අමාත්‍යංශය හා මහ බැංකුවයි. (4) මහා භාණ්ඩාගාරය හා මුදල් අමාත්‍යංශයයි. (.........)

26. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මූල්‍ය නීති පනත මගින් ලබා දී ඇති **ප්‍රමාණාත්මක ණය සීමා උපකරණය** යටතට නොගැනෙන කාර්යය වන්නේ

(1) වාණිජ බැංකු ණය සඳහා කල් පිරීමේ උපරිම සීමා පැනවීම
(2) අලුතින් ණයදීම වැළැක්වීම හෝ සීමා කිරීම
(3) තම තැන්පතු සඳහා ගෙවිය හැකි / අය කළ හැකි පොලී අනුපාත නියම කිරීම
(4) ණයවර ලිපි විවෘත කිරීමේ දී තැබිය යුතු තැන්පතු සීමා කිරීම (.........)

27. නිදහස ලබන විට ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පාලනය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය

(1) එය පාලනය කළේ ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයක් මගිනි.
(2) මුදල් නිකුතුව හා පරිපාලනය යටත් විජිත ලේකම්, භාණ්ඩාගාරික හා විගණකාධිපතිගෙන් යුත් මණ්ඩලයකින් සිදු විය.
(3) ශ්‍රී ලංකා රුපියල එංගලන්ත ස්ටර්ලිං පවුමට ඈඳා තිබුණි.
(4) රටේ ගෙවුම් ශේෂයේ අතිරික්තයක දී ව්‍යවහාර මුදල් නිකුතුව ප්‍රසාරණය විය. (.........)

28. මහ බැංකු වාර්තාවට අනුව 2005 ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල වාර්ෂික ආදායම ඇමෙරිකන් ඩොලර්

(1) 1 100 ට වැඩි (2) 1 200 ට වැඩි
(3) 1 300 ට වැඩි (4) 1 400 ට වැඩි (.........)

29. ළමා පෝෂණය සම්බන්ධයෙන් 1948 සිට රජයන් විසින් ගෙන ඇති විවිධ පියවර අතුරෙන් සත්‍ය **නොවන්නේ**

(1) 1980 කොළ කැඳ සැපයීමේ වැඩ සටහන
(2) 1992 පෝෂණය පිළිබඳ ජාතික තාක්ෂණ කමිටුව
(3) 1995 ලුණුවලට අයඩීන් මිශ්‍ර කිරීමේ නීතිය
(4) 1989 ප්‍රථම වරට පාසල් සිසු දිවා ආහාර වේල සැපයීම (.........)

[ 5 වැනි පිටුව බලන්න.

30. උසස් අධ්‍යාපන අංශයේ ආයතනීය සංවර්ධනය උදෙසා පසුගිය රජයන් ගෙන අති පියවර අතුරෙන් අදාළ **නොවන** ප්‍රකාශය
   (1) 1978 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ස්ථාපනය කිරීම
   (2) 1979 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවීම
   (3) 1981 සියලු විශ්ව විද්‍යාල සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව පිරි නැමීම
   (4) 1996 ඔලුවිල් හි ගිනිකොන දිග විශ්ව විද්‍යාලය පිහිටුවීම (.........)

31. හිඟ බදු අය කර ගැනීම හා බදු අනුකූලතා නොදක්වන අවස්ථා සඳහා නඩු කඩිනම් කිරීමේ අරමුණින් 2005 පිහිට වූ විශේෂ උසාවි හතර පිහිටියේ
   (1) ගම්පහ, මහනුවර, ගාල්ල, කළුතර
   (2) ගම්පහ, අනුරාධපුර, මහනුවර, කොළඹ
   (3) අනුරාධපුර, මහනුවර, ගම්පහ, ගාල්ල
   (4) ගාල්ල, කොළඹ, අනුරාධපුර, ගම්පහ (.........)

32. කලින් SAPTA දකුණු ආසියාතික වරණීය වෙළෙඳ ගිවිසුම පසුව
   (1) දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම විය. (SAFTA)
   (2) බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා (බෙංගාල බොක්ක) ගිවිසුම විය. (BIMSTEC)
   (3) විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුම විය. (CEPA)
   (4) වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ගිවිසුම විය. (GSPT) (.........)

33. පසුගිය වසරක කාල පරිච්ඡේදය තුළ දී වෙළෙඳ හා තීරු බදු ක්‍රමය සම්බන්ධ ව රජය විසින් ගනු **නොලැබූ** ක්‍රියා මාර්ගයක් වන්නේ
   (1) පකිස්ථානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ආරම්භ කිරීම
   (2) බර වාහන ආනයනය මත පැනවූ 27.5% ක රේගු බද්ද 6% දක්වා අඩු කිරීම
   (3) නියමානුකූල බදු ගෙවන්නන්ට සහනයක් වශයෙන් CC ධාරිතාව 1500 ට අඩු මෝටර් කාර් ආනයනයේ දී 25% ක බදු සහනයක් ලබාදීම
   (4) සහල් ආනයනය මත පනවා තිබූ කිලෝ ග්‍රෑම් 1 කට රු.9/= ක් වූ බද්ද රු.5/= දක්වා අඩු කිරීම (.........)

34. දැනට සමස්ත ජනතාව අතුරෙන් බදු ගෙවන 2% ක් වූ ප්‍රමාණය මේ වසරේ කුමන ප්‍රතිශතයකින් වැඩි කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අරමුණ ද?
   (1) 5% (2) 7% (3) 10% (4) 12% (.........)

35. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කුමන ව්‍යාපාරය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට අපේක්ෂිත ද?
   (1) මොරගහකන්ද ජලාශය
   (2) නිල්වලා යෝජනා ක්‍රමය
   (3) ත්‍රිකුණාමල තාප විදුලි බලාගාරය
   (4) කුකුලේගම ව්‍යාපාරය (.........)

36. මෙවර ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ දී ලසිත් මාලිංග එකවිට කඩුලු හතරක් ලබා ගත්තේ කුමන කණ්ඩායමට එරෙහිව ද?
   (1) එංගලන්ත
   (2) බටහිර ඉන්දීය කොදෙව්
   (3) දකුණු අප්‍රිකාව
   (4) බංග්ලාදේශය (.........)

37. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) නව විෂය නිර්දේශය යටතේ ප්‍රථම වරට විභාගය පැවැත්වෙන්නේ
   (1) 2007 දී ය.
   (2) 2008 දී ය.
   (3) 2009 දී ය.
   (4) 2010 දී ය. (.........)

38. විදුලි බලය නොමැති දුෂ්කර ග්‍රාමීය පාසල් සිසුන් සඳහා "සූර්ය බල පරිගණක විද්‍යාගාර" සඳහා ණය ආධාර සපයන්නේ
   (1) ඉන්දියාවයි.
   (2) මැලේසියාවයි.
   (3) කොරියාවයි.
   (4) ජපානයයි. (.........)

39. නව ආදර්ශ ප්‍රාථමික පාසල් ව්‍යාපෘතිය යටතේ දැනට මහනුවර දිස්ත්‍රික්කයෙහි ආරම්භ කර ඇති ප්‍රාථමික පාසල වන්නේ

(1) ගැටඹේ ප්‍රාථමික විද්‍යාලය, ගැටඹේ  (2) පේරාදෙණිය කනිටු විදුහල, පේරාදෙණිය
(3) හන්දෙස්ස ප්‍රාථමික විදුහල, හන්දෙස්ස  (4) ජනාධිපති ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය, දොඩම්වල (.........)

40. "මිනිපේ ඇළ" ඉදි කරවන ලද්දේ

(1) පළමුවන අග්බෝ රජු ය.  (2) මහසෙන් රජු ය.
(3) මහා පරාක්‍රමබාහු රජු ය.  (4) දෙවන මුගලන් රජු ය. (.........)

41. යෝධ ඇළ (ජය ගඟ) විසින් සම්බන්ධ කරන වැව් දෙක වන්නේ

(1) කලා වැව – තිසා වැව  (2) මින්නේරිය වැව – මහකනදරාව වැව
(3) මින්නේරිය වැව – හුරුළු වැව  (4) විලච්චිය වැව – මානාකුලම් වැව (.........)

42. ලෝකයේ ප්‍රථමයෙන් ම බිහි වූ ශිෂ්ටාචාරය වශයෙන් සැලකෙන්නේ

(1) මිසර ශිෂ්ටාචාරයයි.  (2) හොවැංහෝ ශිෂ්ටාචාරයයි.
(3) මෙසපොටේමියා ශිෂ්ටාචාරයයි.  (4) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (.........)

43. සුරතල් මසුන් ඇති කරන ටැංකියක ඔක්සිජන් හිඟයක් ඇති බව පෙන්නුම් කරන මත්ස්‍ය චර්යාව වන්නේ

(1) උන් ටැංකියේ පතුලේ සිටී.  (2) කරමල් හා මුඛය වැඩි වේලාවක් විවර කර සිටී.
(3) උන් වඩා වේගයෙන් පිහිනයි.  (4) ජල පෘෂ්ඨය ආසන්නයේ රැඳෙමින් ශ්වසනය කරයි.(.........)

44. ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන සම්මත සිමෙන්ති බෑගයක සිමෙන්ති බර කිලෝග්‍රෑම්

(1) 50  (2) 12  (3) 55  (4) 100 (.........)

45. මූලද්‍රව්‍ය කිහිපයක් ඒකාබද්ධ කිරීමෙන් සකස් කර ඇති ලෝහය වන්නේ

(1) වානේ  (2) තඹ  (3) ටින්  (4) රිදී (.........)

46. නුවර යුගයේ චිත්‍ර කලාව එතෙක් රටේ පැවති ස්වභාවික පරිමාණයන්ගෙන් මිදී ශෛලිගත සම්ප්‍රදායන්ට පාත්‍ර වූයේ

(1) මානව රූප පරිමාණානුකූලව ඇඳීමේ ශිල්පීන්ගේ හිඟය නිසා ය.
(2) කල්පිත හැඩතල වඩා අගය කිරීම නිසා ය.
(3) කාලීන අවශ්‍යතාවලට අනුරූප සරළ සම්ප්‍රදාය අනුගමනය කිරීම නිසා ය.
(4) ලෞකික තත්ත්වයේ සිට ලෝකෝත්තර තත්ත්වයට චිත්‍ර කලාව පත් කිරීමේ අභිප්‍රාය නිසා ය. (.........)

47. ජාත්‍යන්තර සාක්ෂරතා දිනය වශයෙන් සැලකෙන්නේ

(1) සැප්තැම්බර් 08  (2) අගෝස්තු 08
(3) ඔක්තෝබර් 08  (4) නොවැම්බර් 08 (.........)

48. සිංහරාජ වනාන්තරයට මායිම් වන දිස්ත්‍රික්ක වන්නේ

(1) රත්නපුර, ගාල්ල, කළුතර  (2) රත්නපුර, කළුතර, මාතර
(3) රත්නපුර, මාතර, ගාල්ල  (4) මාතර, ගාල්ල, කළුතර (.........)

49. මුදල් නෝට්ටු සම්බන්ධ මහ බැංකු වාර්තාවට අනුව සත්‍ය **නොවන** ප්‍රකාශය වන්නේ

(1) වැඩි වටිනාකමකින් යුතු මුදල් නෝට්ටුවල ආයු කාලය වැඩි ය.
(2) අඩු වටිනාකමකින් යුතු මුදල් නෝට්ටුවල ආයු කාලය අඩු ය.
(3) වටිනාකම කෙසේ වෙතත් ස්වභාවය අනුව සියලුම නෝට්ටුවල ආයු කාලය සමාන ය.
(4) අඩු වටිනාකමෙන් හා වැඩි වටිනාකමෙන් යුතු වුවත් සියලු ම නෝට්ටු සමාන ප්‍රමිතියකින් මුද්‍රණය කෙරේ. (.........)

50. තැන්පතු භාර ගැනීම සඳහා රජය විසින් දැනට අවසර දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු ගණයට අයත් **නොවන්නේ**

(1) වයඹ සංවර්ධන බැංකුව  (2) ජාතික ඉතිරි කිරීමේ බැංකුව
(3) මහජන බැංකුව  (4) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (.........)

* * *